වැවිලි අමාත්‍යාංශය

සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

තනතුරු පුරප්පාඩු

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර - **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන)**

ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-1)

වයස - වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ)

වැටුප් පරිමාණය - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 80,295 - 15 X 2,270 - 114,345/- (මාසික) වැටුප් පරිමාණයක් තිබේ. ඔට අමතරව රජය මගින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

සුදුසුකම් - **බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා, කෘෂිකර්මය, වැවිලි කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි සංවර්ධන / කෘෂි ව්‍යාපෘති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි සංවර්ධන / කෘෂි ව්‍යාපෘති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවර්ධන / ව්‍යාපෘති කටයුතු පිළිබඳව කළමනාකරණ MM 1-1 සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

තනතුර - **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**

කළමනාකාර සේවා ගණය (HM 1-1)

වයස - වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ)

වැටුප් පරිමාණය - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 80,295 - 15 X 2,270 - 114,345/- (මාසික) වැටුප් පරිමාණයක් තිබේ. ඔට අමතරව රජය මගින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

සුදුසුකම් - **බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය හෝ වැවිලි කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් පශ්චාත් උපාධි ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි ව්‍යාපෘති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කෘෂි ව්‍යාපෘති කටයුතුවලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් මඳවා ගැනීම

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවර්ධන / ව්‍යාපෘති කටයුතු පිළිබඳව කළමනාකාර (MM 1-1) සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

මඳවාගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදුකරන අතර ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි වේ.

අදාළ පළපුරුද්ද	-	ලකුණු 30
අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්	-	ලකුණු 30
අනෙකුත් කාර්යය සාධනයන් සහ කුසලතා	-	ලකුණු 15
සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය	-	ලකුණු 25
මුළු ලකුණු ගණන	-	**ලකුණු 100**

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

තනතුර - **සහකාර කළමනාකරු (පාලන)**

කළමනාකාර සේවා ගණය (MM 1-1)

වයස - වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ)

වැටුප් පරිමාණය - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 53,175 - 10 X 1375 - 15 X 1910 - 93,575/- (මාසික) වැටුප් පරිමාණයක් තිබේ. ඔට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

සුදුසුකම් - **(අ) බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

සහ

උපාධිය ලබාගැනීමේන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පරිපාලන / මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත බාහිර අයදුම්කරුවන් මඳවා ගැනීමට අදාළ සුදුසුකම්

හෝ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කනිෂ්ඨ කළමනාකරණ JM සේවා ගණයේ මානව සම්පත් සහ පරිපාලනයට අදාළ තනතුරක වසර පහ (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

මඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කරන අතර ලකුණු ලබාදීම පහත සඳහන් වේ.

I.	අදාළ පළපුරුද්ද	- ලකුණු 30
II.	අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම්	- ලකුණු 30
III.	වෙනත් කුසලතා හා කාර්යය සාධනයන්	- ලකුණු 15
IV.	සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය	- ලකුණු 25
	මුළු ලකුණු ගණන	- **ලකුණු 100**

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

තනතුර - **පරිපාලන නිලධාරී**

කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1-II)

පුරප්පාඩු සංඛ්‍යාව - 02

වයස - වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ)

වැටුප් පරිමාණය - මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 42,000 - 10 X 755 - 18 X 1,135 - 70,580 (මාසික) වැටුප් පරිමාණයක් තිබේ. ඔට අමතරව රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

සුදුසුකම් - **(අ) බාහිර අයදුම්කරුවන් මඳවා ගැනීම**

විශ්වවිද්‍යල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් මඳවා ගැනීම

ඉහත බාහිර අයදුම්කරුවන් මඳවා ගැනීමට අදාළ සුදුසුකම්

හෝ

පරිපාලන විෂය කටයුතුවලට අදාළව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර (පාස්මේන්ත නොවන) MA 1-2 සේවා ගණයේ II වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

මඳවා ගැනීමේ ක්‍රමවේදය - පත්වීම් මඟපාරය විසින් තීරණය කරනු ලබන පරිදි ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් මඟපාරය විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙන් මඳවා ගැනීම සිදු කෙරේ.

ලිඛිත තරග විභාගය

ලිඛිත තරග විභාගය සඳහා වූ විෂය නිර්දේශය පහත දක්වේ.

- භාෂා ප්‍රවීනතාව
- අභියෝගතා පරීක්ෂණය
- තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම

භාෂා ප්‍රවීනතාවය :

ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, සරල ව්‍යාකරණ රීති භාවිතය යන කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම ඔත්ත බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

අභියෝගතා පරීක්ෂණය :

ඕය නිල කාර්යයන් ඔත්තවන් ඉටු කිරීමේදීලා අපේක්ෂකයාගේ අභියෝගතාවය ද හැකියාව ද ඔත්ත බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

තනතුරට අදාළ වන පරිදි විෂය දැනුම :

තනතුරට අදාළ වන පරිදි කියමින විෂය කරුණු පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

විභාගය සමස්ථයක් සඳහා අපේක්ෂකයකු එක් විෂයයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතු අතර, ලකුණු මුළු එකතුව 50% ක් අවම වශයෙන් ලබාගත යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් මඳවා ගැනීම

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි වේ.

1.	අදාළ අතිරේක පළපුරුද්ද	- ලකුණු 30
2.	අදාළ අතිරේක සුදුසුකම්	- ලකුණු 30
3.	වෙනත් කුසලතා හා කාර්යය සාධනයන්	- ලකුණු 15
4.	සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය	- ලකුණු 25
	මුළු ලකුණු ගණන	- **ලකුණු 100**

- ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් මඳවා ගනු ලබන විට තරග විභාගයෙන් ලබාගත් ලකුණු එකතුව 60% ක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු 40% ක් වශයෙන් යොදා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කෙරේ.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් තෝරා ගැනෙන විට තුදෙක්ම එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබේ.

වේතන - සුම මඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

අමතර ප්‍රතිලාභ - සේවාවිත හා බාහිර වෛද්‍යධාර යෝජන ක්‍රමය යටතේ පහසුකම්.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතට හෝ රක්ෂ පනත යටතේ ඇති සේවකයන්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට හෝ තෝරාගනු ලබන අයදුම්කරු විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔහුගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 10% කට නොඅඩු මුදල් ප්‍රදානය කරනු ලබන අතර අධිකාරිය විසින් 13% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ සාර අරමුදල් සඳහා 3% ක් අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

අයදුම්පත් - අයදුම්කරුවන් සියලු විස්තර සමග තම අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික සහ පසුපරුද්ද දක්වෙන සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් මනාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශ සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2022 පෙබරවාරි මස 26 වැනි දින හෝ ඊට පූර්ව පහත අය වෙන ලෙසත සේ එවිය යුතුය.

තනතුරු,
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර, පඬුවස්න, මහරගම්මුල්ල.